# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2009
2010 අගෝස්තු /සැප්තැම්බර්

මානවශාස්ත්‍ර පීඨය

ප්‍රතිබිම්බ කලා - IMAT - E3015

ඡායාරූප කලාව සහ විචාරය

<u>ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි — කාලය : පැය 03 යි

---

01. මානව ශිෂ්ටාචාරයේ විවිධ අවධීන්හි බිහි වූ සන්නිවේදන මාධ්‍ය හා කලා මාධ්‍ය අතර ඡායාරූප ශිල්පයට හිමිවන්නේ කුමන ස්ථානයක් ද යන්න තුලනාත්මක ව විග්‍රහ කරන්න.

02. ප්‍රවෘත්ති, වාර්තා, නිර්මාණ යන අංශත්‍රයෙහි ඡායාරූප ශිල්පය ව්‍යවහාරයට ගත හැක්කේ කවරාකාරයෙන් දැයි නිදසුන් සහිතව විමසන්න.

03. සම්ප්‍රදායික රසාස්වාද රීතියට අනුව ඡායාරූපයක් විචාරය කිරීමේ දී ඔබ සලකා බලන කරුණු සැකෙවින් පහදන්න.

04. රූප සංරචනය (composition) පිළිබඳ අවබෝධය ඡායාරූප ශිල්පියෙකුට අවශ්‍ය වන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

05. පහත සඳහන් මාතෘකා **<u>හතරකට (04)</u>** කෙටි සටහන් ලියන්න.

I. රූප රාමුව (Frame)
II. පර්යාවලෝකනය (Perspective)
III. අමූර්ත සංකල්ප ක්‍රමය (Abstract method)
IV. ඡායාරූප ශිල්පය පිළිබඳ සහභාගී (FNPAS) සම්මානය
V. ජාත්‍යන්තර ඡායාරූප කලා සම්මේලනය (The International Federation of Photographic Art)
VI. අධිතාත්ත්වික ඡායාරූප (Surrealism Photographic Art Photography)

06. ''ඡායාරූප ප්‍රදර්ශන සහ එහි සමාජීය වැදගත්කම'' යන මාතෘකාව යටතේ කෙටි පුවත්පත් ලිපියක් සම්පාදනය කරන්න.

07. පහත සඳහන් ඡායාරූප ශිල්පීන්ගේ සුවිශේෂත්වය කෙටියෙන් හඳුන්වා දෙන්න.

I. ලයනල් වෙන්ඩ්ට්
II. ඇන්සල් ඇඩම්ස්
III. රොබට් ඩෙමාකි
IV. ඇල්ෆ්‍රඩ් ස්ටිග්ලිට්ස්

08. පහත දැක්වෙන ඡායාරූපයේ ප්‍රකාශනාත්මක හා කලාත්මක වටිනාකම පිළිබඳ විවරණයක් කරන්න.



******************************